GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2025.11.24

මාධ්‍ය නිවේදනය

**වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය පද්ධතියේ ගැටලු වලට ඉදිරිපත් කල විසඳුම් සඳහා නිශ්චිත කාල රාමුවක් ප්‍රකාශයට පත් නොවන්නේ නම් ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කිරීම පැය 48 කින්.**

මෙවර අයවැය තුළින් වෛද්‍යවරුන්ගේ සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සැබෑ ගැටලු කිසිවක් සඳහා සාධනීය විසඳුම් නොලැබීමේ පසුබිමක, ශ්‍රී ලාංකීය නිදහස් සෞඛ්‍ය සේවාවේ අනාගතය සම්බන්ධයෙන් දැඩි අවිනිශ්චිතතාවයක් පැන නැගී ඇත.

මෙවර අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර, ප්‍රමාණවත් කාලයක් තුළ වෛද්‍යවරුන්ගේ සහ සෞඛ්‍ය සේවාවේ ගැටලු විසඳීම සඳහා අදාළ තොරතුරු සහ යෝජනා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් ජනාධිපතිතුමා ඇතුළු වගකිවයුතු පාර්ශවයන් වෙත යොමු කළ ද, ඒවා අවධානයට ලක්නොකිරීම තුල, වත්මන් අර්බුදය පැන නැගී ඇත.

මෙම ගැටලු සඳහා සාධනීය විසඳුමක් නොලැබීම හේතුවෙන් වෘත්තීය ක්‍රියාමාර්ග ගණනාවකට එළඹීමට රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයට සිදුවිය.

එහෙත් මෙතෙක් රෝහල් පද්ධතිය තුල රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය විසින් කිසිදු වැඩ වර්ජනයක් ප්‍රකාශයට පත් කර නැති බවද අවධාරණය කල යුතුය.

මෙම වෘත්තිය ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් යළි සලකා බැලීම සඳහා අපගේ ඉල්ලීම වූයේ සෞඛ්‍ය පද්ධතිය සහ වෛද්‍යවරුන් රැක ගැනීම ඉලක්ක කරගත් නිශ්චිත සාධනීය වැඩපිළිවෙලක් කාල රාමුවක් සහිතව ප්‍රකාශයට පත් කිරීමයි.

එහිදී පසුගිය සෙනසුරාදා පැවැත්වුණු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අයවැය කාරක සභා විවාදය වෙත අපගේ දැඩි අවධානය යොමු වූ අතර, සෞඛ්‍ය පද්ධතිය සහ වෛද්‍යවරුන් මුහුණ දී ඇති ගැටළු පිළිබඳ තොරතුරු රාශියක් පාර්ලිමේන්තුවේදි සාකච්ඡාවට ලක්වනු දක්නට ලැබින.

සෞඛ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුරු කතාවේදී, වෛද්‍යවරුන්ගේ ගැටලු විසඳීම සම්බන්ධයෙන් යම් විසඳුම් යෝජනා කිහිපයක් ප්‍රකාශයට පත් වුවද, නිශ්චිත කාලරාමුවක් ප්‍රකාශයට පත් නොකිරීම මත එම යෝජනාවලියේ ඉදිරි ක්‍රියාවලිය පිළිබඳ අවිනිශ්චිතතාවයක් මතුවී ඇත.

පවතින ප්‍රවණතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හදිසි විධායක සභා රැස්වීමක් අද පැවැත්වුනු අතර, එහිදී ඒකමතික අදහස බවට පත්වූයේ අදාළ විසඳුම් සඳහා කාල රාමුවක් ප්‍රකාශයට පත් කිරීම අනිවාර්ය වන බවයි.

ඒ අනුව එම කාල රාමුව සහිත විසඳුම් මාලාව ප්‍රකාශයට පත් කිරීම සඳහා, ඉදිරි පැය 48ක කාලය වගකිවයුත්තන්ට ලබාදීමටත්, එසේ කිරීමට අසමත් වන්නේ නම්, එළඹෙන බදාදා (2025.11.26) දිනයේදී පැවැත්වෙන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මධ්‍යම කාරක සභා රැස්වීමේදී මීට වඩා දැඩි වෘත්තිය ක්‍රියාමාර්ග වෙත යොමු වීම සම්බන්ධයෙන් වන තීන්දු තිරණ සාකච්ඡා කිරීමට නියමිතය.

එබැවින් ජනාධිපතිතුමා, සෞඛ්‍ය අමාත්‍යතුමා ඇතුලු වගකිවයුත්තන් වෛද්‍යවරුන්ගේ සහ සෞඛ්‍ය පද්ධතියේ ගැටලු විසඳීම වෙනුවෙන් නිශ්චිත කාලරාමුවක් සහිත විසඳුම් මාලාවක් ප්‍රකාශයට පත් කිරිම තුල වර්තමානයේ සෞඛ්‍ය පද්ධතිය තුල උද්ගත වී ඇති ගැටලුකාරි තත්ත්වය විසඳීම සඳහා වහාම මැදිහත් විය යුතු බව අපි විශ්වාස කරමු.

ස්තූතියි.
මීට විශ්වාසී,

වෛද්‍ය ප්‍රභාත් සුගතදාස,
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

| | | |
|---|---|---|
| වෛද්‍ය චමිල් විජේසිංහ(මාධ්‍ය ප්‍රකාශක) | - | 0717080041 |
| වෛද්‍ය පාලිත රාජපක්ෂ | - | 0718480300 |
| වෛද්‍ය අජන්ත රාජකරුණා | - | 0766736296 |
| වෛද්‍ය වසන්ත වීරසූරිය ආරච්චි | - | 0773526063 |
| වෛද්‍ය හංසමාල් වීරසූරිය | - | 0776549339 |
| වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ | - | 0777829001 |
| වෛද්‍ය වාරුනි කොහොඹන්ගේ | - | 0714410467 |
| වෛද්‍ය අන්ෆාස් ෆාරුක් | - | 0771115117 |
| වෛද්‍ය ආර්. තනිගවාසන් | - | 0772369608 |
| වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ | - | 0716812160 |
| වෛද්‍ය සංජීව තල්ගහගොඩ | - | 0716173330 |